# තනතුරු පුරප්පාඩු

## වැවිලි අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පහත දැක්වෙන පුරප්පාඩු පිරවීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති කාර්යශීලී, උද්යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත් තනතුර – HM (1-1)

**රැකියා පිරිවිතරය :**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති/අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ මණ්ඩලීය පරිපාලන කටයුතු (ප්‍රවාහන, ආරක්ෂක, පුස්තකාලය සහ නඩත්තු කටයුතු සහ මානව සම්පත් කළමනාකරණ හා සංවර්ධන කටයුතු, ප්‍රසම්පාදන කටයුතු) ඉටුකිරීම සහ කාර්ය සාධන ඇගයීම් සඳහා ආයතනයේ භෞතික හා මූල්‍ය ඉලක්ක පසුවිපරම් කිරීම හා විශ්ලේෂණය කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය/ව්‍යාපාර පරිපාලනය/මානව සම්පත් කළමනාකරණ/නීතිය යන විෂයන්ගෙන් එකක් යටතේ ලබාගත් ප්‍රථම උපාධිය

සමග

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලන හෝ ව්‍යාපාර පරිපාලනය යන විෂයන් එකක් සම්බන්ධයෙන් අවම වශයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ප්‍රථම උපාධි සුදුසුකම ලැබීමෙන් අනතුරුව පරිපාලනය සහ මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයක අවම වශයෙන් අවුරුදු 15 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් ( අ හෝ ආ කාණ්ඩය)**

(අ) උක්ත බාහිර කාණ්ඩය යටතේ දක්වා ඇති සුදුසුකම සපුරා තිබීම.

හෝ

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි මධ්‍යම කළමනාකරණ (MM) 1 ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වැටුප් පරිමාණය : HM 1-1 - 02/2016 : රු. 80,295 - රු.2270 x 15 - රු.114,345**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි ප්‍රතිපාදන අනුව **රු. 80,295/-** ආරම්භක මාසික වැටුප මත පිහිටුවා එම වැටුපද එයට අමතරව මාසිකව **රු.7800/-** ජීවන වියදම් දීමනාවද දැනට බලපැවැත්වෙන චක්‍රලේඛ ප්‍රකාරව වෘත්තීය දීමනාවද ගෙවනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 අනුව ඉන්ධන දීමනාව සහිතව මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන රියැදුරෙකු සහිත වාහනයක් අනුයුක්ත කිරීමට හෝ එසේ නොවන්නේනම් දැනට අනුමත ප්‍රවාහන දීමනාව ගෙවීමට කටයුතු කරනු ලැබේ.

**වයස් සීමාව :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

### සංඛ්‍යා ලේඛණඥ තනතුර - MM1-1 (II ශ්‍රේණිය)

**රැකියා පිරිවිතර :**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි සහ තේ කර්මාන්තයට අදාල තොරතුරු රැස්කිරීමේ විශ්ලේෂණය, සංඛ්‍යාන වාර්තා සකස් කිරීම සහ විෂය පථය යටතට ගැනෙන සියළු රාජකාරි කටයුතු ඉටු කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්**

1. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සංඛ්‍යානය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම.

සහ

එම උපාධිය ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (1 හෝ 2)**

1. උක්ත බාහිර කාණ්ඩය යටතේ සඳහන් සුදුසුකම සපුරා තිබීම

හෝ

2. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ II ශ්‍රේණියේ කණිෂ්ඨ කළමනාකරණ (JM1-1) තනතුරක අදාල ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

**වැටුප් පරිමාණය : MM 1-1- 2016 : රු.53,175 - 10 × රු.1375 - 15 × 1910 - රු.95,575**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි ප්‍රතිපාදනඅනුව බාහිර අයදුම්කරු ආරම්භක මාසික වැටුප් පියවර වන රු. 53,175/- මත පිහිටුවා එම වැටුපද හා එයට අමතරව රජයේ අනුමත මාසික ජීවන වියදම් දීමනාව වන රු. 7800/- හා වෘත්තීය දීමනාවද ගෙවනු ලැබේ.

**වයස් සීමාව :**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වෙනත්/පොදු ප්‍රතිලාභ :**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

**පොදු කොන්දේසි :**

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ඇත.
- අභ්‍යන්තර අයදුම්කරුවන් අදාල තනතුරු සඳහා තෝරා ගතහොත් දැනට පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත වැටුප් පරිමාණයේ අදාල වැටුප් පියවර මත පවතිනු ඇත.

**අයදුම් කිරීම :**

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **http://www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත්, උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග **2021 අගෝස්තු 24** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**574, ගාලුපාර,**
**කොළඹ 3.**